# බළන්ගොඩ නගර සභාව - ටෙන්ඩර් දැන්වීම

## බළන්ගොඩ නගර සභාවට අයත් සම්පත් පියස (ඔරලෝසු කණුව අසළ) ඉහළ මහලේ දැන්වීම් පුවරුවක් සවිකිරීම සඳහා සුදුසු බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.

බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියස (ඔරලෝසු කණුව අසළ) ඉහළ මහලේ දිග අඩි 40 x උස 12 ප්‍රමාණයේ දැන්වීම් පුවරුවක් සවිකර ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2025 පෙබරවාරි මස 13 වන දින සිට, 2026 පෙබරවාරි මස 12 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ද්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මා විසින් 2025 පෙබරවාරි මස 11 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුළ දී නගර සභා කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබා ගත හැකිය.

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම:**

2025 පෙබරවාරි මස 10 වන දින ප.ව.3.00 දක්වා ටෙන්ඩර්පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් භාර ගැනීම:**

2025 පෙබරවාරි මස 11 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ **ලේකම්, බළන්ගොඩ නගර සභාව** යන ලිපිනයට 2025 පෙබරවාරි මස 11 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් විවෘත කිරීම:**

2025 පෙබරවාරි මස 11 දින පෙ.ව.10.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

**උපලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර් කැඳවනු ලබන දැන්වීම් පුවරුවේ නම හා අංකය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම වාර්ෂික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 1 | සම්පත් පියස (ඔරලෝසු කණුව අසළ) ඉහළ මහලේ දිග අඩි 40 x උස 12 ප්‍රමාණයේ දැන්වීම් පුවරුව | රු.5,000.00 | රු.1,000.00 | රු.144,000.00 |

**විශේෂ කොන්දේසි:**

- ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදල හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් වාර්ෂික ටෙන්ඩර් මුදලින් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුළිය දැන්වීම් පුවරු බදුගත් අය විසින් 2025.02.13 දින අවසාන වන විට එකවර ගෙවා ගිවිසුම් අත්සන් කළ යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු අඩි 40 x 12 ප්‍රමාණයේ දැන්වීම් පුවරුව බලන්ගොඩ නගර සභාවේ කාර්මික නිලධාරී මහතාගේ තාක්ෂණික උපදෙස් අනුව යෝග්‍ය සනකම සහිත ගැල්වනයිස් බට (ජී.අයි) යොදා ශක්තිමත් ආධාරක සහිතව දැන්වීම්පුවරුව සම්පත් පියස ඉහල මහලේ බදුකරු විසින් සකස්කරගතයුතුය.
- ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.
- ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම්පත්‍රය සමග ලබා දෙනු ලැබේ.

2025 ජනවාරි මස 27 වන දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම් හා බලතල, කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
බළන්ගොඩ නගර සභාව.